**මැදවච්චිය ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-----------------**

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ** විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 21 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට **මැදවච්චිය** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉකුත් වර්ෂයේදී ලැබී තිබුණු රු. 42,562 ක වරිපනම් ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් අතිරික්තය එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මාර්ග 17 ක් පිළිසකර කිරීම වෙනුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු. 2,334,658 ක් කර්මාන්ත ණයගැතියෝ ලෙස ගිණුම්ගතකර නොතිබීම හේතුවෙන් ණයගැතියෝ සහ ප්‍රාග්ධන ආදායම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබුණු රු. 49,310 ක පුස්තකාල පොත් ගිණුම් ගතකර නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංවර්ධන ව්‍යාපෘති ඉටු කිරීම වෙනුවෙන් ලැබිය යුතු හා ගෙවිය යුතු රු.987,092 ක වටිනාකම් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඉ) ආගමික සිද්ධස්ථාන හා දහම් පාසල් සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති 03 ක් සඳහා වූ සියයට 10 ක අතරුඳවුම් රු.30,000 ක් ණයගැතියෝ ලෙස හඳුනාගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ණයගැතියෝ එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් කර 2018 වර්ෂයේ ගෙවීම් කර තිබුණු රු. 1,960,708 ක් වටිනා ව්‍යාපෘති 04 ක් සඳහා ගෙවියයුතු හා ලැබියයුතු මුදල් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ණයගැතියෝ සහ ණයහිමියෝ එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) පළාත් සභා විමධ්‍යගත අරමුදල් යටතේ ඉටුකළ ව්‍යාපෘති 15 ක එකතුව රු.180,267 ක්වූ අතරුදවුම් මුදල්, ණයහිමියෝ ලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ණයහිමියෝ එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) නව වෙළඳ සංකීර්ණයේ කඩකාමර බදුදීම වෙනුවෙන් වූ ටෙන්ඩර් ඇප තැන්පත් රු. 798,000 ක් ජංගම වගකීම් යටතේ පෙන්වා නොතිබුණි.

(එ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ නවීකරණය කරන ලද රු.7,621,808 ක් වටිනා ඉදිකිරීම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු ගිණුම් විෂයයන් 05 කට අදාල ලේඛනවල දැක්වෙන අගයන් සහ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් අතර රු.10,921,223 ක වෙනසක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

ලැබිය යුතු ගිණුම්

-------------------

වර්ෂ කිහිපයක සිට පැවත එන එකතුව, රු.18,672,035 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 08 ක් සමාලෝචිත වර්ෂයේදී හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ගෙවිය යුතු ගිණුම්

--------------------

2009 වර්ෂයට පෙර සිට හා 2017 වර්ෂය දක්වා පවත්වාගෙන එනු ලබන එකතුව රු. 1,585,762 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 08 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

-----------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.85,568,402 ක් වූ ගිණුම් විෂයන් 16 ක් සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.**

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 177 වගන්තිය | සභාවේ සේවය කරන තාවකාලික අනියම් සේවකයන් වෙනුවෙන් පාරිතෝෂික ගෙවීම් සඳහා වූ යෝජනා ක්‍රමයක් ස්ථාපිත කර නොතිබුණි. |
| (ආ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සභාව සතුව පවතින පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳව ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1994 අගෝස්තු 04 දිනැති NCP/LG/4/7/19 චක්‍රලේඛය | ප්‍රධාන තක්සේරුකරුවකුගේ තක්සේරුව පදනම් කර කඩකාමර කුලී තීරණය කළ යුතු වුවත්, සභාව වර්ෂ 22 ක් තිස්සේ කඩ කාමර කුලී තක්සේරු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,136,497 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,585,846 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම් ,තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් වර්ගය | 2017 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය වටිනාකම | 2017 වර්ෂයේ බිල්කල ආදායම වටිනාකම | 2017 රැස්කළ ආදායම 2017.01.01 හිඟය වටිනාකම | 2017 රැස්කළ ආදායම 2017 බිල්කළ මුදලින් වටිනාකම | 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම වටිනාකම |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් | 1,064,057 | 859,559 | 169,018 | 592,167 | 1,162,431 |
| කඩ කාමර කුලී | 106,050 | 854,400 | 48,300 | 746,000 | 166,150 |
| වෙළඳ බලපත්‍ර | 505,700 | 1,450,000 | - | 2,234,630 | 505,700 |
| බදුකුලී | 1,120,994 | 5,772,700 | - | 5,772,700 | 1,120,994 |
| එකතුව | 2,796,801 | 8,936,659 | 217,318 | 9,345,497 | 2,955,275 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

-----------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) **වරිපනම් හා බදු**

**-----------------**

2017 දෙසැම්බර් 31 දිනට රු.1,115,096 ක්වූ හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) වෙළඳ බලපත්‍ර

----------------

2017 දෙසැම්බර් 31 දිනට හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු රු.505,700 ක ශේෂයෙන් රු.489,700 ක් 2008 වර්ෂයේ සිට පැවත එන අතර එම ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) මුද්දර ගාස්තු

--------------

2018 මාර්තු 15 දින වන විට සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු හිඟහිටි මුද්දර ගාස්තු රු. 1,910,961 ක් විය.

(ඈ) උසාවි දඩ

-----------

2018 මාර්තු 15 දින වන විට සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු හිඟහිටි උසාවි දඩ රු. 2,454,590 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්යසාධනය

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා, විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

----------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනත 1999 මාර්තු 19 දින අංක 1072 දරන ගැසට් පත්‍රය මගින් වැළඳගෙන ඇතත්, අතුරු ව්‍යවස්ථාවල සඳහන් කර්තව්‍යයන් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

-------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ඇ) පාරිසරික ගැටළු

-------------------

සභාව මගින් කසළ ප්‍රතිචක්‍රිකරන වැඩසටහන ක්‍රියාවට නගා තිබුණු නමුත් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

i කසළ රැස් කිරීම සහ වර්ගීකරණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාවට නගා නොතිබුණු බැවින් එකතුවන කසළ වර්ගීකරණයකින් තොරව පොදු ස්ථාන අසල දමා තිබුණි.

ii. ප්ලාස්ටික්,විදුරු හා පොලිතින් වැනි නොදිරන ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය නොකර ඉසින්බැස්සගල වන රක්ෂිතයට මුදාහරින බව නිරීක්ෂණය විය.

(ඇ) තිරසර සංවර්ධනය

----------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ සමාලෝචිත වර්ෂය තුල සභාව දැනුවත් වී නොතිබුණු අතර 2018 වර්ෂයේ සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී අරමුණු 09 කෙරෙහි අවධානය යොමු කර තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

ප්‍රාදේශීය සභා පනතේ 171 වගන්තිය අනුව ප්‍රාදේශීය සභා අරමුදල සහ දේපල පරිපාලනය කිරීම සඳහා කාර්ය පටිපාටි සකස් කර නොතිබුණි.

3.3 මනාව සම්පත් කළමනාකරණය

-----------------------------------

1995 සිට 2011 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල ස්ථානමාරුවී ගිය, මිය ගිය,විශ්‍රාම ගිය සහ සේවය හැර ගොස් තිබුණු සේවකයින් 12 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබුණු රු. 194,593 ක් වූ සේවක ණය 2017 දෙසැම්බර් 31 දින වනවිටත් අයකරගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 168 වගන්තියට අනුකූලව සකස් කරන අයවැය ලේඛනය නිසි පුරෝකථනයකින් යුක්තව සකස් නොකිරීම හේතුවෙන් අයවැයගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 09 සිට සියයට 330 ක පරාසයයකින් යුක්ත විචලතාවයන් පවතින බව නිරීක්ෂණය විය.

4.2 අභ්‍යන්තර විගණනය

--------------------------

උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු

---------------------------------------

2009 ජුනි 09 දිනැති DMA/2009(1) කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති චක්‍රලේඛය අනුව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

**5 පද්ධති හා පාලන**

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ). | ගිණුම්කරණය | ගිණුම් පොත්පත් යාවත්කාලීනව නඩත්තු නොකිරීම. |
| (ආ) | ස්ථාවර වත්කම් | i. ස්ථාවර වත්කම් නිසි පරිදි ගිණුම්ගත නොකිරීම.<br>ii. සමීක්ෂණය පවත්වා නොතිබීම.<br>iii. වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම. |
| (ඇ). | අභ්‍යන්තර පාලනය | අභ්‍යන්තර විගණනය සහ විගණන සහ කළමනාකරණ කමිටු ක්‍රියාත්මක නොකිරීම. |